හේවාවසම්, එච්. පී. කේ. එන්.
PAPER

## සමාජ පාලනය උදෙසා ඉපැරණි ලාංකීය සිංහල සාහිත්‍යයේ දායකත්වය කෙබඳුවේද?

එච්. පී. කේ. එන්. හේවාවසම්, සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මිනිස් සමාජය යනු මිනිස් එකතුවකි. එය නොනැසී පවතින්නා වූ මිනිස් දාමයකින් සැදි එකම පාලන තන්ත්‍රයකින් හා එකම භූගෝලීය පසුබිමකින් සමන්විත සංස්කෘතිකමය සැකැස්මකි. ආදි කාල්පික සමාජයේ සිට මේ දක්වාම සමාජය විවිධ හැල හැප්පීම්වලට ලක්වුවත්, සමාජ අත්තිවාරමේ ශක්තිමත් බඳාමයක් මඟින් එය ආරක්ෂා කරමින් මේ දක්වාම ඉදිරියට එනු ඇත. එවැනි ආරක්ෂිත අත්තිවාරමක් ලෙස සමාජ පාලන කාරකයන් හැඳින්වීමට හැකිය. සමාජ පාලන යනු පුද්ගලයාගේ හා සමූහයාගේ හැසිරීම් විධිමත් ව පවත්වාගෙන යන්නා වූ නියතයකි. අපගාමීත්වයෙන් තොර වූ සමාජයක් බිහි කරනු වස් සෑම සමාජ ව්‍යුහයකම පවත්නා විවිධ වූ විධිමත් සමාජ පාලන ක්‍රමෝපායන්ගේ මූලික පාදම යෙදී ඇත්තේ එම සමාජය අතීත යුගයේ ක්‍රියාකාරි වූ ආකාරය අනුවය. එම නිසා අවිධිමත් ආකාරයෙන් සිදු වූ සමාජ පාලන ක්‍රමෝපායන් අධ්‍යයනය නූතනයේ අත්‍යවශ්‍ය කරුණක් වේ.

සිංහල ගැමි සමාජ ක්‍රමය තුළද අවිධිමත් සමාජ පාලන ක්‍රම විවිධ ස්වරූප ගෙන ඇත. එය වක්‍රාකාරයෙන් අපරාධ පාලනය හා නිවාරණය උදෙසා ද ප්‍රබල බලපෑමක් සිදු කරනු ලබයි. ඒ අනුව පැරණි සාහිත්‍ය පත පොත මෙන් ම, ජනවහර එයට ලබාදෙනුයේ අපූර්වාන්විත ආලෝකයකි. එවැනි සාහිත්‍ය මූලාශ්‍ර තුළින් හෙළිවන සමාජ පාලනය පිළිබඳව ගවේෂණාත්මකව අධ්‍යයන කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ.

අධ්‍යයන ක්‍රමවේදය යටතේ ද්විතියික මූලාශ්‍ර ඇසුර යොදාගැනීම සිදුවන අතර, එහිදී අපගේ ජනකථා, කවි, බෞද්ධ පොතපත භාවිත කෙරේ. ඒ අනුව පැරණි සිංහල සාහිත්‍යධරයන් රචනා කරන්නට යෙදුණු බොහෝමයක් ග්‍රන්ථ සමාජ පාලනයෙහි ලා සිදු කොට ඇති දායකත්වය අවතක්සේරු කළ නොහැකිය. ජාතක කථා, උපදේශකාත්මක කෘති ආදිය මඟින් මිනිස් ප්‍රජාවගේ හිතසුව පිණිස කර ඇති දායකත්වය ඉතා පැහැදිලි කරුණකි. එය ආදි කාලීන මිනිසා අපරාධ, අපගාමීත්වයෙන් මුදා සර්ව සුභවාදී සමාජ ව්‍යුහයක් ගොඩ නැගීමට හේතු වූ බව මෙහි දා සඳහන් කිරීම අතිශයෝක්තියක් නොවනු ඇත.